01

අධිචෝදනා පත්‍රය

කළුතර මහාධිකරණය - HIGH COURT KALUTARA
15 MAY 2019

කළුතර අධිකරණ කලාපයේ

මහාධිකරණය

නීතිපතිගේ අංකය : ඒපී/ටී/16/2004

මහාධිකරණයේ අපරාධ නඩු අංකය } එච්.සී. 375/04

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය

විරුද්ධව

01.දොන් චමින්ද පද්මකුමාර ජයසේකර කුලසිංහ.

02.පැටිකිරි ආරච්චිගේ දොන් දුල්ලසේන ගුණතිලක.

03.මැටිවල කුඹුරේ මුදුන්කොත් ගෙදර විජයදාස.

01

මහාධිකරණය කළුතර - HIGH COURT KALUTARA
15 MAY 2019

කලුතර මහාධිකරණය.

නඩු අංකය = එච්.සි.375/2004

දිනය = 2008.11.14

නි යෝ ග ය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය

විරුද්ධව

01. දොන් චමින්ද පද්මකුමාර ජයසේකර කුලසිංහ

02. පැටිකිරි ආරච්චිගේ දොන් දුල්ලසේන ගුණතිලක

03. මැටිවල කුඹුරේ මුදුන්කොත් ගෙදර විජේදාස

විත්තිකරුවෝ

නීතිපති තුමා විසින් විත්තිකරුවන්ට විරුද්ධව මෙම නඩුව පවරා ඇත්තේ වර්ෂ 2001 ක් වූ සැප්තැම්බර් මස 15 වන දින හෝ ඊට ආසන්න දිනයකදී මෙම අධිකරණයේ බල සීමාව තුල පිහිටි කලුතර දී පැමිණිල්ල නොදත් අන් අය සමග මිනීමැරුමක් සම්බන්ධව සැකපිට පොලිස් අත්අඩංගුවට ගන්නා ලද වෙඩිප්පුලිආරච්චිගේ ධනපාල පෙරේරා යන අයට ඔහු විසින් කරන ලදැයි සැක කරන එකී ක්‍රියාව සම්බන්ධයෙන් යම් තොරතුරක් ලබා ගැනීම සඳහා හෝ එකී තැනැත්තා බිය ගැන්වීම සඳහා වධ දුන් බැවින් දණ්ඩ නීති සංග්‍රහයේ 32 වන වගන්තිය සමග කියැවිය යුතු 1994 අංක 22 දරණ වධ දීමට සහ අනෙකුත් කෲර අමානුෂික හෝ නින්දිත සැලකිමට හෝ දඩුවම්වලට එරෙහි වූ සම්මුතිය පනතේ 2 (Iv) වන වගන්තිය යටතේ දඩුවම් ලැබිය යුතු වරදක් සිදු කල බවය.

මෙම නඩුවේ පැමිණිල්ල වෙනුවෙන් වෙඩිප්පුලි ආරච්චිගේ ධනපාල, වෙඩිප්පුලි ආරච්චිගේ ජනක ප්‍රියංක පෙරේරා, වීරකෝන්ගේ නන්දනී ශ්‍රියාලතා,

15 MAY 2019

මංගගේ ගයාන් ජයශාන්ත, ජොෂ්ඨ පොලිස් අධිකාරි ආනන්ද ලයනල් අමරසේකර, අතුලුවගේ දොන් සරතචන්ද්‍ර, මර්සි සෙල්වරත්නම් විනයාගමූර්ති යන අයවලුන් සාක්ෂි දී ඇත. ඉන් අනතුරුව පැමිණිල්ල විසින් පැ. 01 ලෙස ලකුණු කරන ලද ලේඛණය ඉදිරිපත් කරමින් පැමිණිල්ලේ නඩුව අවසන් කර ඇත. ඉන් අනතුරුව විත්තිය වෙනුවෙන් පෙනී සිටි උගත් නීතිඥ වරුන් විසින් මෙම නඩුවේ ප්‍රධාන සාක්ෂිකරු වූ ධනපාල නමැත්තාගේ සාක්ෂිය අනුව අපරාධ නඩු විධාන සංග්‍රහයේ 200 ( 01 ) යටතේ ඉල්ලීමක් කිරීමට අවශ්‍ය බව දන්වා ඇත. ඉන් අනතුරුව විත්තිකරුවන් වෙනුවෙන් පෙනී සිටි උගත් නීතිඥ මහත්වරුන් එකී පනතේ 200 ( 01 ) වගන්තිය යටතේ විත්ති වාචකයක් කැඳවීමෙන් තොරව විත්තිකරුවන් නිදොස් කර නිදහස් කරන ලෙසට ඉල්ලා ඇති අතර, ඒ සම්බනධව ලිඛිත කරුණු අධිකරණය වෙත ඉදිරිපත් කර ඇත.

මෙම නඩුවේ පැමිණිල්ලේ ස්ථාවරය වූයේ මෙම නඩුවේ විත්තිකරුවන් විසින් මෙම නඩුවේ පළවන සාක්ෂිකරු වූ වෙඩිප්පුලි ආරච්චිගේ ධනපාල පෙරේරා නමැත්තාව කලුතර දී සිදු වූ මිනීමැරුමක් සම්බන්ධයෙන් සැකපිට 2001 සැප්තැම්බර් මස 15 වන දින අත්අඩංගුවට ගෙන කලුතර දකුණ පොලිස් ස්ථානයට ගෙනැවිත් රඳවා තබා ඔහුට එම මිනීමැරුම සම්බන්ධයෙන් තොරතුරු ලබා ගැනීම සඳහා අමානුෂික ලෙස පහර දීමෙන් ඉහත 1994 අංක 22 දරණ පනතේ විධි විධාන යටතේ දඩුවම් ලැබිය යුතු වරදක් සිදු කර ඇති බවය. මෙම නඩුවේ සාක්ෂි දුන් ධනපාල පෙරේරා නැමති පහරදීමට ලක් වූ පුද්ගලයා කියා සිටියේ මෙම සිද්ධිය වූ දිනට පෙර ඔහු විසින් ඉහත කී මිනිමැරුම සම්බන්ධයෙන් තොරතුරු සොයා බලා කලුතර පොලිසියට නිර්නාමිකව දුරකථනයෙන් සහ නිර්නාමික පෙත්සම් මඟින් දැනුම් දුන් බවත්,

ඊට අමතරව පොලිස්පතිතුමාටත්, කලුතර මහෙස්ත්‍රාත්තුමාටත්, දැනුම් දුන් බවත්, ඉන් අනතුරුව මෙම සිද්ධිය වුණු දින මෙම විත්තිකරුවන් ඔහුගේ නිවසට පැමිණ ඔහුව අත්අඩංගුවට ගත් බවත්, ඉන් අනතුරුව ඔහුව කලුතර දකුණ පොලිසියට රැගෙන ගොස් සිර කුඩුවේ දමා ඔහුගෙන් ප්‍රශ්න කර ප්‍රකාශයක් සටහන් කර ගැනීමෙන් අනතුරුව එම පොලිස් ස්ථානයේ තිබූ වෙනත් කාමරයකට ගෙන ගොස් ඔහුට අමානුෂික ලෙස පහර දුන් බවට සාක්ෂි දී ඇත. මෙම සාක්ෂිකරු විසින් මෙම විත්තිකරුවන් ඔහුට පහර දුන් ආකාරය සම්බන්ධයෙන් විස්තරාත්මක ප්‍රකාශයක් අධිකරණයේ කර ඇත. ඉන් අනතුරුව ඔහුව නැවතත් පොලිසියේ සිර කුඩුවට දමා පසුදින කලුතර මහේස්ත්‍රාත් තුමා වෙත ඉදිරිපත් කිරීමෙන් අනතුරුව හඳුනා ගැනීමේ පෙරෙට්ටුවක් පැවැත්වූ අතර, එහිදී ඔහුව කිසිවෙකුත් හඳුනා නොගත් අතර, ඊට දින කිහිපයකට පසුව ඔහුව ඇප මත මුදා හරින ලද බවය. ඉන් අනතුරුව ඔහු මෙම සිද්ධිය පිළිබඳව මානව හිමිකම් කොමිසමට දැන්වූ බවත්, ඉන් අනතුරුව ගරු ශ්‍රේෂ්ඨාධිකරණයට මානව හිමිකම් උල්ලංඝණය කිරීම පිළිබඳව පැමිණිල්ලක් කළ බව සඳහන් කර ඇත.

තවදුරටත් මූලික සාක්ෂි මෙහෙයවන අවස්ථාවේ දී මෙම විත්තිකරුවන් විසින් ඔහුට පහර දෙන ලද්දේ ඔහුගේ ප්‍රකාශය සටහන් කර ගැනීමෙන් පසුව බවට සාක්ෂි දී ඇත.

ප්‍ර. මේ මිනී මැරුම් නඩුවට අදාළව තමාගෙන් ප්‍රකාශයක් ගත්තාද ?

උ. මාව අත් අඩංගුවට අරගෙන පහර දෙන්න කලින් ප්‍රශ්න කලා.

ප්‍ර. තමන්ට පහර දුන්නා කිව්වා ?

උ. ප්‍රකාශයක් කලාට පස්සේ තමයි මට පහර දුන්නේ.

HIGH COURT 15 MAY 2019

HIGH COURT
15 MAY 2019

යනුවෙන් සාක්ෂි දී ඇත. ඉන් අනතුරුව මෙම සාක්ෂිකරු විසින් ඔහුට පහර දෙන ලද පුද්ගලයන් වශයෙන් විත්ති කූඩුවේ සිටි විත්තිකරුවන් 04 දෙනාව හඳුනාගෙන ඇත. මෙම නඩුවේ පලවන විත්තිකරු වෙනුවෙන් හරස් ප්‍රශ්න අසන අවස්ථාවේ දී මෙම සාක්ෂිකරු කියා සිටියේ ඔහු කලුතර දී වුණු මිනීමැරුමට අදාළ සැකකරුවන් ගැන දැනගත් බවත්, ඔහු විසින් එම සැකකරුවන් ඔහුගේ නිවසට ගෙන්වාගෙන සිද්ධිය සම්බන්ධයෙන් සාකච්ඡා කළ අතර, රංග නමැති එක් සැකකරුවෙක් අදාළ මිනී මැරුම සිදු කිරීමට උපයෝගී කර ගන්නා ලද පිහිය පවා ඔහුට පෙන්වූ බව ප්‍රකාශ කර ඇත. පළවන විත්තිකරු වෙනුවෙන් පෙනී සිටි උගත් නීතිඥ මහතා යෝජනා කර ඇත්තේ මෙම මිනී මැරුම සිදු කර ඇත්තේ සාක්ෂිකරුගේ පුත්‍රයෙකු බවත් ඔහුව බේරා ගැනීම සඳහා සාක්ෂිකරු වෙනත් පුද්ගලයන්ගේ නම් පොලීසියට ලබා දී ඇති බවත්ය. තවද, මෙම සිද්ධියෙන් අනතුරුව සාක්ෂිකරු ඔහුගේ ඉහත කී පුත්‍රයාව පොළොන්නරුවේ හත්තක, උඩවෙල ඔහුට අයත් නිවසකට පිටත් කර යවා ඉන් අනතුරුව සාක්ෂිකරුද එහි ගොස් රැඳී සිටි බවය. සාක්ෂිකරු ඒ සම්බන්ධයෙන් පිළිතුරු දෙමින් කියා සිටියේ ඔහුගේ පුත්‍රයාව එසේ පොළොන්නරුවේ පිහිටි නිවසට යවන ලද්දේ අදාළ මිනී මැරුම සම්බන්ධයෙන් ඔහුගේ පුත්‍රයා සිද්ධියට සම්බන්ධ පුද්ගලයන් ගැන දැන සිටි බැවින්, ඔහුගේ ජීවිතයට අනතුරක් වේය යන බියෙන් බවත්, ඔහුටද යම් අනතුරක් වේය යන බිය උඩ ඔහුද පොළොන්නරුවට ගිය බවට ප්‍රකාශ කර ඇත. විශේෂයෙන් ඔහු කියා සිටියේ අලුබෝමුල්ල ප්‍රදේශයේ කසිප්පු විකුණන පුද්ගලයෙකුගෙන් ඔවුන්ට තර්ජනය තිබුණු බැවින් එසේ ගිය බවය. මෙම සාක්ෂිකරුගෙන් හරස් ප්‍රශ්න අසන අවස්ථාවේ දී ඔහු කියා සිටියේ ඔහුව අත්අඩංගුවට ගැනීමට පැමිණි පුද්ගලයන්ගෙන් ගුණතිලක නමැති මෙම නඩුවේ

2 වන විත්තිකරු ඔහුගේ නිල ඇඳුමේ ගසා තිබුණු නමින් දැනගත් බවත් අනෙකුත් පුද්ගලයන් ඔහු නම් වශයෙන් නොදන්නා අතර ඔහු ඇප දී පැමිණි පසු එම නම් ඔහු විසින් සොයා ගත් බවය. මෙම සාක්ෂිකරුගේ සාක්ෂිය සනාථ කිරීම සඳහා එකී ධනපාල පෙරේරා යන අයගේ සහෝදරයෙකු වන ජනක ප්‍රියංක පෙරේරා, නන්දනී ශ්‍රියාලතා සහ එකී ධනපාල පෙරේරා සමග සිද්ධිය වුණා යයි කියන දින පොලිස් සිර මැදිරියේ සිට ගොස් ජයශාන්ත පීරිස් යන අය පැමිණිල්ල කැඳවා ඇත. ධනපාල පෙරේරා නමැත්තාගේ සහෝදරයා වූ ජනක ප්‍රියන්ත පෙරේරා මෙම අධිකරණයේ සාක්ෂි දී ඇති අතර, ඔහුගේ සාක්ෂියෙන් හෙළිදරව වී ඇත්තේ මෙම සිද්ධිය වූ දින පළවන සාක්ෂිකරු වන ධනපාල පෙරේරා නමැත්තාව අලුබෝමුල්ලේ පිහිටි ඔහුගේ නිවසේ සිට අත්අඩංගුවට ගෙන රැගෙන ගිය බවට සාක්ෂි දී ඇති අතර, ඔහු කියා සිටියේ ඉන් අනතුරුව සිද වූ දේවල් සම්බන්ධයෙන් ඔහු නොදන්නා බවත් පසුව ඔහුත් ධනපාල පෙරේරාගේ මවත්, සුදර්මා නැමැත්තියත් ඔහුව බැලීම සඳහා කලුතර දකුණ පොලීසියට ගිය බවත්, එහිදී ඔහුට ධනපාල නැමැත්තාව මුණගැසීමට ඉඩ නොදුන් බවත්, පසුව කලුතර රක්ෂණ බන්ධනාගාරයට ඇතුලත් කිරීමෙන් අනතුරුව එහිදී මුණගැසුණ බවත්, එම අවස්ථාවේදී ධනපාල පෙරේරා පොලිස් නිලධාරීන් විසින් ඔහුට පහර දුන් බවත්, ඔහුට අමාරු බවට පැවසූ බවත් පමණක් පැවසූ බවට ප්‍රකාශ කර ඇත. නමුත් ඔහුට පහර දුන් අය කව්රුන්ද යන්න පැවසූ බව ප්‍රකාශ කර නැත. ඉන් අනතුරුව පැමිණිල්ල විසින් කැඳවූ ජයශාන්ත පීරිස් යන අය කියා සිටියේ මෙම සිද්ධිය වුණු දින ඔහුව ද පොලිස් අත්අඩංගුවට ගෙන කලුතර දකුණ පොලීසියට රැගෙන ආ බවත්, ඒ එන අතරතුර ධනපාල පෙරේරා නැමැත්තාට ඔහු රැගෙන ආ නිලධාරීන් විසින් බැන්න බවත්, ගැසුව බවත් කියා ඇත. නමුත් ධනපාල

15 MAY 2019
HIGH COURT KALUTARA

15 MAY 2019
HIGH COURT

පෙරේරාගේ සාක්ෂි වලින් ඔහුට ජීප් රථයේ දී පහර දීමක් කළ බවට සාක්ෂි දී නැත. ඉන් අනතුරුව පොලිස් ස්ථානයේ දී ධනපාල පෙරේරා නැමැත්තාට කිසිවකු විසින් හෝ පහර දෙන බව ඔහු නොදුටු බවත්, සිර මැදිරිය තුළ සිටින අවස්ථාවේ දී ධනපාල පෙරේරා යන අයව සිර මැදිරියෙන් එළියට ගෙන ගිය බවත්, නැවත විනාඩි 20 කට පමණ පසු ධනපාල පෙරේරාව නැවත කුඩුවට ගෙන ආ බවත්, එම අවස්ථාවේ දී ධනපාල පෙරේරා යන අයට යම්කිසි අමාරුවක් තිබෙනවා ඔහු නොදුටු බවට සාක්ෂි දී ඇත. ඔහු පවසා ඇත්තේ ධනපාල පෙරේරා නැවත සාමාන්‍ය විදියට සිර මැදරිය තුළට පැමිණි බව ය. නමුත් යම් අවස්ථාවක ධනපාල පෙරේරාගේ අතක් ඉදිමී තිබෙනවා දුටු බවත්, පොලිසිය පහර දුන් බව පැවසු බවත් ඔහු කියා ඇත. ඔහුගේ මෙම සාක්ෂියෙන් කුමන අවස්ථාවකදීවත් මෙම විත්තිකරුවන් ධනපාල පෙරේරාට පහර දෙනවා දුටු බවට හෝ මෙම විත්තිකරුවන් තිදෙනා අතරින් කිසිවෙකු හෝ ධනපාල පෙරේරාව සිර මැදිරියෙන් ගෙනියනවා දුටු බවක් හෝ අවම වශයෙන් ඔවුන් අත්අඩංගුවට ගන්න අවස්ථාවේදී මෙම නිලධාරීන් පැමිණි බවට හෝ සාක්ෂි දී නැත.

ඉන් අනතුරුව පැමිණිල්ල විසින් කැඳවනු ලැබුවේ කලුතර දකුණ පොලීසියේ සේවය කරන නන්දනි ශ්‍රියාලතා නැමැත්තියයි. ඇය කියා සිටියේ ඇය කලුතර දකුණ පොලිසීයේ භාරකාර මාතාවක් ලෙස කටයුතු කරන බවත්, මෙම සිද්ධිය වුණා යයි කියන දිනයේ ඇය එම පොලීසියේ රාත්‍රී කාලයේ සේවයේ නියැලී සිටි බවය. පැමිණිල්ල විසින් අසන ලද ප්‍රශ්නවලට උත්තර දෙමින් ඇය කියා සිටියේ මෙම නඩුවේ විත්තිකරුවන් පෙනීසිටින්නේ එවකට එම පොලිසියේ සේවය කරන නිලධාරියෙකු- බවත්, එම සිද්ධිය වුණ දින රාත්‍රී

සාක්ෂිය අනුව ඔහුගේ ශරීරයේ දැකගැනීමට තිබූ විශේෂ තුවාලයක් වශයෙන් ඇය සඳහන් කර ඇත්තේ අත්වල වැලමිටේ තිබූ තුවාලයක් ය. හරස් ප්‍රශ්න වලට පිළිතුරු දෙමින් ඇය කියා සිටියේ අත්විලංගු දැමීමේදී ද මෙවැනි තුවාල විය හැකි අතර, එම තුවාල රළු පෘෂ්ඨයක ගැවීමෙන් හෝ ඇතිල්ලීම වැනි දෙයකදී සිදුවිය හැකි බවට ය. ඔහුට සිදුවූ තුවාල වැටීමකින් හෝ සිදුවිය හැකි බවටත් ඇය සාක්ෂි දී ඇත. පැමිණිල්ල විසින් ඉහත කී වෛද්‍යවරියට අමතරව තවත් වෛද්‍යවරුන් දෙදෙනෙකුව සාක්ෂිකරුවන් වශයෙන් නම් කර තිබුණද, පැමිණිල්ල විසින් ඔවුන් සාක්ෂි දීම සඳහා කැඳවා නැත. ඒ අනුව මෙම සාක්ෂිකරුට සිදුවූ තුවාල සම්බන්ධයෙන් පැහැදිලි නිගමනයකට එළඹීමට අධිකරණයට නොහැකිවී ඇති බවට නිගමනය කරමි.

15 MAY 2019
HIGH COURT KALUTARA

මෙම නඩුවේ පැමිණිල්ල වෙනුවෙන් කැඳවූ පොලිස් අධිකාරි ආනන්ද ලයනල් අමරසේකර යන අය කියා සිටියේ ශ්‍රේෂ්ඨාධිකරණ නියෝගයක් මත මෙම නඩුවට අදාලව පැමිණිල්ලේ සහ විත්තිකරුවන්ගේ සාක්ෂි සටහන් කර ගනු ලැබූ බවය. ඊට අමතරව ඔහු විසින් මෙම චූදිතට විරුද්ධව ඇති චෝදනාව සනාථ කිරීම සඳහා වෙනත් සාක්ෂියක් ඉදිරිපත් කර නැත.

ඉහත සඳහන් කරුණු අනුව මෙම නඩුවේ විත්තිකරුවන්ට විරුද්ධව ඇති චෝදනාව ඔප්පු කිරීමට ඇති එකම සාක්ෂිය පහර කෑමට ලක්වූවා යැයි කියන ධනපාල පෙරේරා යන අයගේ සාක්ෂිය පමණි. මෙම සාක්ෂිකරුගෙන් විත්තියේ උගත් නීතිඥ මහතෙකු විසින් දින ගණනාවක්ම හරස් ප්‍රශ්න අසා ඇත. මෙහිදී මූලික ප්‍රශ්නවලට පිළිතුරු දෙමින් ඔහු පවසා ඇතතේ ඔහුව ගරු මහෙස්ත්‍රාත්තුමා වෙත ඉදිරිපත් කල අවස්ථාවේදී ඔහු උගත් මහේස්ත්‍රාත්තුමාට ප්‍ර : තමා මහේස්ත්‍රාත්තුමාට ඉදිරිපත් කල අවස්ථාවේදී මහේස්ත්‍රාත්තුමාට සිද්ධිය කිව්වාද ? යන ප්‍රශ්නයට උත්තර වශයෙන් " මම

15 MAY 2019 HIGH COURT

කිව්වා මට පහර දීලා අමාරුයි කිව්වා. ඒ වේලාවේ බන්ධනාගාරයෙන් බෙහෙත් දෙයි කිව්වා.

ප්‍ර. කවුද පහර දුන්නේ කියා ඇහුවාද ?

උ. නැහැ. ඇහුවේ නැහැ. එදා දවසේම හිටියේ බඩගින්නේ.

යනුවෙන් සාක්ෂි දී ඇත. ඉන් අනතුරුව ඔහු මූලික සාක්ෂිවලට පිළිතුරු දෙමින් කියා ඇත්තේ ඔහුව මහෙස්ත්‍රාත් තුමා වෙත ඉදිරිපත් කිරීමෙන් අනතුරුව රක්ෂණ බන්ධනාගාරගත කළ බවත්, රක්ෂණ බන්ධනාගාරයට ඇතුළත් කළ අවස්ථාවේ දී ඔහු එහි නිලධාරින්ට " ගියාට පස්සේ මම කිව්වා පහර දීලා හුඟක් අමාරුයි කියා එම අවස්ථාවේ දී ඔහු විසින් එසේ පවසා ඇත්තේ 16 වන දින බවට මූලික සාක්ෂියේ දී සාක්ෂි දී ඇති අතර, බන්ධනාගාර නිලධාරින් විසින් ඔහුව පරීක්ෂා කර බලා ඔහුව බන්ධනාගාරයට ගෙනාපු නිලධාරියාගෙන් ප්‍රකාශයක් සහ ඔහුගෙනුත් ප්‍රකාශයක් ගත් බවට සාක්ෂි දී ඇත. එම අවස්ථාවේදී බන්ධනාගාර නිලධාරීන් විසින් ඔහුට "කරන්න දෙයක් නැහැ රෝහලට ඉදිරිපත් කරන්න බැහැ, හඳුනාගැනීමේ පෙරෙට්ටුවකට ඉදිරිපත් කරන්න තිබෙනවා කිව්වා. රෝහලකට ඉදිරිපත් කළෙත් නැහැ. වෛද්‍යවරයෙකු පරීක්ෂා කළේත් නැහැ" යනුවෙන් සාක්ෂි දී ඇත. ඉන් අනතුරුව ඔහුව කොළඹ බන්ධනාගාරයට ඇතුළත් කර බලා ප්‍රතිකාර ලබාදුන් බවට සාක්ෂි දී ඇත. මෙම සාක්ෂිකරුගෙන් වැඩිදුර මූලික සාක්ෂි මෙහෙයවන අවස්ථාවේදී ඔහුව බන්ධනාගාරගත කර සතියකට පසු පෙරෙට්ටුවෙන් අනතුරුව ඔහුගේ නීතිඥ මහතා මගින් පහර දීම සම්බන්ධයෙන් සහ ඔහුට අමාරු බව උගත් මහෙස්ත්‍රාත්තුමාට දැන්වූ නමුත් උගත් මහෙස්ත්‍රාත්තුමා ඒ වේලාවේ ප්‍රතිකාර දෙන්න කියා කියූ බවට පැවසූ බවට සාක්ෂි දී ඇත.

මෙම නඩුවේ විත්තිය වෙනුවෙන් පෙනීසිටි නීතිඥ මහතුන්ගේ හරස් ප්‍රශ්නවලට පිළිතුරු දෙමින් ධනපාල පෙරේරා නැමැති පහර කෑමට ලක්වූ අය කියා සිටියේ ඔහු විසින් ඔහුගේ මානව හිමිකම් උල්ලංඝනය වූ බවට ගරු ශ්‍රේෂ්ඨාධිකරණයට පෙත්සමක් ඉදිරිපත් කළ බවත්, එම පෙත්සම විභාගයෙන් අනතුරුව මෙම නඩුවේ විත්තිකරුවන් තිදෙනා වරදකරුවන් බවට තීන්දු කරන ලද බව ය. විත්තිය වෙනුවෙන් මෙම සාක්ෂිකරු ගරු ශ්‍රේෂ්ඨාධිකරණයට ඉදිරිපත් කරන ලද දිවුරුම් පෙත්සමේ සඳහන් කරුණු සම්බන්ධයෙන් හරස් ප්‍රශ්න අසා ඇත. ඔහු විසින් ගරු ශ්‍රේෂ්ඨාධිකරණයට ඉදිරිපත් කරන ලද දිවුරුම් ප්‍රකාශයේ පවසා ඇත්තේ මෙම විත්තිකරුවන් ඔහුව අත්අඩංගුවට ගෙන පොලිස් ජීප් රථයේ රැගෙන යන අවස්ථාවේදී ඔහුව ජීප් රථයේ බිම දිගා කොට පයින් පාගා පහර දීම් කළ බවය. නමුත් ඔහු විසින් මෙම අධිකරණයේ පවසා ඇත්තේ ඔහුව පොලිස් ජීප් රථයේ සාමාන්‍ය ලෙස වාඩි කරවාගෙන පැමිණි බවත්, ඒ එන අතරතුරදී ඔහුට පහරදීම් සිදු නොකළ බවත් ය. මෙම කරුණ සම්බන්ධයෙන් විත්තියේ නීතිඥ මහතා හරස් ප්‍රශ්න අසන අවස්ථාවේදී සාක්ෂිකරු ගරු ශ්‍රේෂ්ඨාධිකරණයට අසත්‍යයක් ප්‍රකාශ කළ බව පිළිගෙන ඇත. එම කොටස විත්තිය විසින් 2වී3 ලෙස ලකුණු කර අධිකරණයේ අවධානයට යොමු කර ඇත. මෙම සාක්ෂිකරු මූලික සාක්ෂි දෙන අවස්ථාවේදී කියා සිටියේ විත්තිකරුවන් විසින් "උඹ අපිත් එක්ක කියාපු ඒවා අපි පටිගත කරලා තිබෙන්නේ. අලුබෝමුල්ල හන්දියට අරගෙන ගිහිල්ලා මිනීමරුවන්ට ඇහෙන්න දානවා කිව්වා. ඒ හැර වෙන මොනවත් නැහැ." එහෙම කිව්වාද යන්නට ඔව් යනුවෙන් පිළිතුරු දී ඇත. ඔහු පවසා සටියේ එම කරුණ ඔහු සැලකිය යුතු කරුණක් ලෙස සැලකූ බවත්, ඔහුව ජීප් රථයේ බිම

15 MAY 2019
KALUTARA

15 MAY 2019
HIGH COURT

දමාගෙන පහරදීම සැලකිය යුතු දෙයක් නොවේ කියන ප්‍රශ්නයට "එහෙම කියන්නේ නැහැ" යනුවෙන් පවසා ඇත. මෙම කරුණ සම්බන්ධයෙන් සාක්ෂිකරු ගරු ශ්‍රේෂ්ඨාධිකරණයට අසත්‍ය ප්‍රකාශයක් කර ඇති බව කලින් සඳහන් කළ බවදී පිළිගෙන ඇත. හරස් ප්‍රශ්න වලට පිළිතුරු දෙමින් කියා සිටියේ පොලිස් ස්ථානයේදී ඔහුට පැය 03 ක් 04 ක් පමණ පහර දුන් බව ය. ඒ සිද්ධිය වුණු දින මධ්‍යම රාත්‍රියේ බවටත් ප්‍රකාශ කර ඇත. නමුත් පැමිණිල්ල වෙනුවෙන් කැඳවූ ගයාන් ජයශාන්ත පීරිස් යන සාක්ෂිකරු කියා සිටියේ මෙම විත්තිකරුව සිර මැදිරියෙන් එළියට ගෙන ගොස් විනාඩි 20 කට පමණ පසු නැවත සිර මැදිරිය තුළට රැගෙන ආ බවය. ඒ අනුව ඔහුට පැය 3ක් 4 ක පමණ කාලයක් පොලිස් ස්ථානය තුළදී පහර දුන්නා යන කියමන ද අධිකරණයට පිළිගත නොහැක. මෙම සාක්ෂිකරු විසින් ගරු ශ්‍රේෂ්ඨාධිකරණයට ඉදිරිපත් කරන ලද දිවුරුම් ප්‍රකාශයේ මෙම සිද්ධිය සම්බන්ධයෙන් ඔහුව ගරු මහෙස්ත්‍රාත්තුමා වෙත ඉදිරිපත් කළ අවස්ථාවේදී එතුමාට පැමිණිල්ලක් කිරීමට ඔහුට පුලුවන්කමක් තිබී නැති බව ය. තවද ඊට අමතරව ගරු ශ්‍රේෂ්ඨාධිකරණයට ඔහු විසින් යම් යම් උදවියගේ බලපෑම් නිසා තර්ජනය කළ නිසා 2001.09.16 දින මහෙස්ත්‍රාත්තුමා වෙත පැමිණිල්ලක් කිරීමට ඔහුට හැකියාවක් නොමැති බවට දිවුරුම් ප්‍රකාශයේ සඳහන් කළ බව පිළිගෙන ඇත. නමුත් ඔහු මෙම අධිකරණයේ සාක්ෂි දෙමින් කියා සිටියේ ඔහු ප්‍රථම වරට ගරු මහෙස්ත්‍රාත්තුමා ඉදිරියට ඉදිරිපත් කළ අවස්ථාවේ දී ඔහුට පොලීසිය විසින් පහර දුන් බව පැවසූ බවත්, එම අවස්ථාවේ දී ගරු මහෙස්ත්‍රාත්තුමා රිමාන්ඩ් එකෙන් බෙහෙත් හම්බවෙයි කියා කියූ බවය. මෙම කරුණ සම්බන්ධයෙන් විත්තිය අසන ලද හරස් ප්‍රශ්න වලදී ඔහු ගරු ශ්‍රේෂ්ඨාධිකරණයට අසත්‍යයක් ප්‍රකාශ කළ බවට පිළිගෙන ඇත. එම කොටස

විත්තිය විසින් 2වී2 ලෙස ලකුණු කර අධිකරණයේ අවධානයට ලක් කර ඇත. මෙම සාක්ෂිකරු හරස් ප්‍රශ්න වලට දී ඇති පිළිතුරු සලකා බැලීමේ දී ඔහු මෙම විත්තිකරුවන්ට විරුද්ධව ගරු ශ්‍රේෂ්ඨාධිකරණයට ඉදිරිපත් කර ඇති දිවුරුම් පෙත්සමේ අසත්‍ය කරුණු ඉදිරිපත් කර ඇති බව පැහැදිලිව පෙනීයයි. මෙම අසත්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ඔහු සාක්ෂි දෙමින් කියා ඇත්තේ එම කරුණු අදාල දිවුරුම් පෙත්සම් සැකසූ ඔහුගේ නීතිඥ මහතා විසින් ඇතුලත් කරන ලද ඒවා බවත්, එය ඉංග්‍රීසි බසින් තිබුණ බවත් ය.

ඊට අමතරව මෙම නඩුවේ පළමුවන විත්තිකරු වෙනුවෙන් පෙනීසිටි උගත් නීතිඥ මහතා හරස් ප්‍රශ්න අසන අවස්ථාවේ දී පරස්පර විරෝධතා අටක් අධිකරණයේ අවධානයට ලක් කර ඇත. එය 1වී1 – 1වී 8 දක්වා ලකුණු කර ඉදිරිපත් කර ඇත. එම හරස් ප්‍රශ්න වලදී පෙන්වා දෙන ලද පරස්පර විරෝධතා සලකා බැලීමේ දී ද මෙම නඩුවේ විත්තිකරුවන් පැහැදිලිවම මෙම නඩුවට පටලැවීම සඳහා දැඩි උත්සාහයක් ගෙන ඇති බව පෙනීයන අතර, සාක්ෂිකරු විසින් දී ඇති පිළිතුරු සලකා බැලීමේ දී ඔහු ඒ ඒ අවස්ථාවට අනුකූලව උත්තර දී ඇති බවත් පෙනීයයි මෙම අධිකරණයේ දී ඔහු පස් වතාවක් පමණ විත්තිය විසින් අසන ලද හරස් ප්‍රශ්න වලට උවමනාවෙන් පිළිතුරු දීම පැහැර හැර ඇති බවත් පැහැදිලිවම පෙනීයයි. මෙම විත්තිකරු විසින් මෙම අධිකරණයේ සාක්ෂි දුන් විලාශය සම්බන්ධයෙන් අධිකරණය විසින් ඔහුගේ සාක්ෂි මෙහෙයවන අවස්ථාවේ දී නඩු වාර්තාවේ වාර්තා ගත කර ඇත. මෙම නඩුවේ පළමුවන විත්තිකරු වෙනුවෙන් පෙනීසිටි උගත් නීතිඥ මහතා කියා සිටියේ මෙම විත්තිකරු ගරු ශ්‍රේෂ්ඨාධිකරණයේ දීත් මෙම අධිකරණයේ දීත් අසත්‍ය ප්‍රකාශ කර ඇති බව පිළිගෙන ඇති කරුණත්,

ඔහු විසින් ඔහුට පහර දුන් පුද්ගලයන් සම්බන්ධයෙන් මානව හිමිකම් කොමිෂමට නම් වශයෙන් සඳහන් නොකිරීමත්, පසු අවස්ථාවලදී කලුතර ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරිවරයාට සහ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට දෙන ලද ප්‍රකාශ වල මෙම විත්තිකරුවන් සම්බන්ධයෙන් පැහැදිලි ප්‍රකාශයක් දී නොමැති බවටත් ප්‍රකාශ කර ඇත. ඊට අමතරව මෙම විත්තිකරු විසින් මානව හිමිකම් කොමිසමට ඉදිරිපත් කර ඇති ප්‍රකාශයේ ඔහුගේ ඇස් වලට මිරිස් කුඩු දමන ලදැයි පවසා ඇත්තේ "දංගල්ල" නැමැති පුද්ගලයෙකු බව සඳහන් කර ඇත. නමුත් ඔහු මෙම අධිකරණයේ සාක්ෂි දෙමින් පවසා ඇත්තේ ඔහුගේ ඇස් වලට මිරිස් කුඩු දමන ලද්දේ මෙම නඩුවේ පළමුවන විත්තිකරු වන කුලසිංහ නැමැත්තා බව ය. නමුත් මෙම සාක්ෂිකරු විසින් මානව හිමිකම් කොමිෂමට හෝ ගරු ශ්‍රේෂ්ඨාධිකරණයට හෝ ඉදිරිපත් කරන ලද පෙත්සම් වල "දංගල්ල" නැමැති පුද්ගලයෙකු සම්බන්ධයෙන් කිසිම සඳහනක් කර නැත. එම කරුණ අනුව ද පැහැදිලිවම පෙනීයන්නේ මෙම සාක්ෂිකරු මෙම නඩුවේ විත්තිකරුවන්ව මෙම නඩුවට උවමනාවෙන් පැටලීමට උත්සහ ගෙන ඇති බව ය. මෙම සාක්ෂිකරු විසින් ගරු ශ්‍රේෂ්ඨාධිකරණයට සහ මෙම අධිකරණයේදී දී ඇති සාක්ෂි අසත්‍ය සාක්ෂි බවට පිළිගෙන ඇති කරුණත් විත්තිය විසින් ලකුණු කර ඉදිරිපත් කර ඇති පරස්පරවිරෝධතා සලකා බැලීමේ දී ඔහු අසත්‍ය ප්‍රකාශයක් කරන පුද්ගලයෙක් බවට පැහැදිලිවම පෙනීයයි. මෙම කරුණ සම්බන්ධයෙන් පළමුවන විත්තිකරු වෙනුවෙන් පෙනීසිටි උගත් නීතිඥ මහතා <u>රජිණ එදිරිව වී.පී.ජුලිස් සහ තවත් අය</u> 65 නව නීති වාර්තාව 205 වන පිටුවේ ඇති නඩු තීන්දුව ගෙන හැර දක්වා කරුණු ඉදිරිපත් කර ඇත. එම නඩු තීන්දුව සැලකිල්ලට භාජනය කිරීමේදී ද

මහාධිකරණය - HIGH COURT KALUTARA
15 MAY 2019

මෙම නඩුවේ සාක්ෂි දුන් ධනපාල පෙරේරා නැමැත්තාගේ සාක්ෂිය මෙම අධිකරණයට පිළිගත නොහැකි බවට නිගමනය කරමි.

මෙම නඩුවේ පළමුවන විත්තිකරු වෙනුවෙන් පෙනීසිටි උගත් නීතිඥ මහතා වැඩිදුරටත් කියා සිටියේ මෙම ධනපාල පෙරේරා නැමැත්තාව අත්අඩංගුවට ගන්නා අවස්ථාවේ දී ඔහුගේ නිවසේ සිටි ඔහුගේ පුද්ගලික ලේකම්වරිය වශයෙන් කටයුතු කළ අය වන සුදර්මා නන්දනී මාරසිංහ නැමැත්තිය මෙම පළමුවන සාක්ෂිකරුගේ සාක්ෂියට පටහැනි ප්‍රකාශයක් පොලිසියට කර ඇති බවත්, එම කරුණ හේතුකොට ගෙන පැමිණිල්ල විසින් ඇයව සාක්ෂි දීමට කැඳවා නැති බවත්, එසේ කැඳවූයේ නම් එම සාක්ෂිය පැමිණිල්ලට අගතිදායක වන හෙයින් බවත් ප්‍රකාශ කර අතර, සාක්ෂි ආඥා පනතේ 114 ඊ වගන්තිය කෙරෙහි අධිකරණයේ අවධානයට ලක් කළයුතු බවට ප්‍රකාශ කර ඇත. එම සාක්ෂිකාරිය විසින් දී ඇති කටඋත්තරයේ පිටපතක් විත්තිය විසින් ඉදිරිපත් කර ඇතත් ඇය මෙම නඩුවේ සාක්ෂි දී නොමැති හේතුව මත එම ප්‍රකාශයේ අඩංගු කරුණ පරීක්ෂා කිරීම නුසුදුසු බවට නිගමනය කරමි.

මෙම නඩුවේ විත්තිකරුවන්ට විරුද්ධව ඇත්තේ මිනීමැරුමක් සම්බන්ධව සැකපිට පොලිස් අත්අඩංගුවට ගන්නා ලද ධනපාල පෙරේරා යන අයට ඔහු විසින් කරන ලදැයි සැකකරන එකී ක්‍රියාව සම්බන්ධයෙන් යම් තොරතුරක් ලබාගැනීම සඳහා හෝ එකී තැනැත්තා බිය ගැන්වීම සඳහා වධ දුන් බැවින්, දණ්ඩ නීති සංග්‍රහයේ 32 වන වගන්තිය සමග කියවිය යුතු 1994 අංක 22 දරණ පණතේ 2 ( Iv ) වගන්තිය යටතේ වරදක් සිදුකල බවය. මෙම

15 MAY 2019

ධනපාල පෙරේරාගේ සාක්ෂිය අනුව මෙම අදාල මිනීමැරුම සම්බන්ධයෙන් ඔහුගේ ප්‍රකාශය සටහන් කරගන්නා අවස්ථාවේදී මෙම නඩුවේ විත්තිකරුවන් විසින් ඔහුට කිසිම පහර දීමක් හෝ වධහිංසාවක් නොකළ බව පිළිගෙන ඇත. ඔහු පවසා සිටින්නේ ඔහුගේ ප්‍රකාශය සටහන් කරගැනීමෙන් අනතුරුව එම විත්තිකරුවන් විසින් ඔහුගේ සාක්ෂියේ සඳහන් පරිදි ඔහුට පහර දී වධහිංසා කළ බව ය. මෙම ධනපාල පෙරේරා ගේ සාක්ෂියේ කුමන ස්ථානයකදී වත් මෙම විත්තිකරුවන් ඔහුට පහර දුන්නේ කුමන හේතුවක් නිසා ද යන්න පවසා නැති අතර, පැමිණිල්ල විසින් එම කරුණ වෙනත් සාක්ෂි වලින් හෝ ඔප්පු කර නැත. ඒ අනුව පැමිණිල්ල මෙම නඩුවේ විත්තිකරුවන්ට විරුද්ධව ඇති චෝදනාවේ අංගයන් ඔප්පු කර නොමැති බවට ද පෙනීයයි.

ඉහත සඳහන් කරුණු සලකා බැලීමේ දී මෙම නඩුවේ විත්තිකරුවන්ට විරුද්ධව ඇති චෝදනාව පැමිණිල්ල විසින් සාධාරණ සැකයෙන් තොරව ඔප්පු කර නොමැති බවට නිගමනය කරමි. ඒ අනුව අපරාධ නඩු විධාන සංග්‍රහයේ 200 (1) වගන්තිය ප්‍රකාරව විත්තිවාචකයක් නොකැඳවා විත්තිකරුවන් නිදොස් කොට නිදහස් කරමි.

අත්/කළේ....

( එච්.ජී.ජේ.පෙරේරා )

මහාධිකරණ විනිසුරු - කලුතර.

2008.11.14

කලුතර මහාධිකරණ විනිසුරු එච්.ඩී.ජේ.පෙරේරා මැතිතුමන් ඉදිරියේදී ය.

ල/ලේ. මානෙල් ප්‍රියංගනී විසින් සටහන් කර ගන්නා ලදී.

නඩු අංකය = එච්.සී.375/04 2008.11.14

15 MAY 2019
HIGH COURT

විත්තිකරුවන් 1,2,3 සිටී.

නියෝගය විවෘත අධිකරණයේදී කියවා දෙන ලදී.

විත්තිකරුවන් නිදොස් කොට නිදහස් කරමි.

අත්/කළේ.....

( එච්.ඩී.ජේ.පෙරේරා )

මහාධිකරණ විනිසුරු - කලුතර

2008.11.14

ඉහතින් සඳහන් වනුයේ කළුතර මහාධිකරණ නඩු අංක එච්.සී. 375/04 දරණ නඩුවේ පිටු අංක 01 සිට 18 දක්වා 2008.11.14 වන දින නියෝගයේ සහ නීති... කාර්‍යයන් සත්‍ය සහතික පිටපතක් බව මෙයින් සහතික කරමි.

සැකසුවේ : 01. Thanali

සැසඳුවේ : 01. [signature]

ලදුපත් අංකය : එෆ් /24 - 378667

2019.05.08

[signature]

රෙජිස්ට්‍රාර්

නියෝජ්‍ය රෙජිස්ට්‍රාර්
මහාධිකරණය
කළුතර